# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 51 — 1973 මාර්තු 16 වැනි සිකුරාදා — 1973.03.16**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# II වැනි කොටස—අධිකරණ

**(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)**


| | පිට | | පිට |
|---|---|---|---|
| පනත් කෙටුම් පත් ... | — | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම ... ... | — |
| ශ්‍රී ලංකා ඇපල් මහාධිකරණයේ දැන්වීම ... ... | — | පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම ... ... | 43 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම ... ... ... | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම ... ... ... | 44 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| මන්තු හංගත්ව නඩු පිළිබඳ දැන්වීම ... ... | — | විවිධ දැන්වීම් ... ... ... ... | — |


සැලකිය යුතුයි.—(i) අපරාධ නඩු විධාන (සංශෝධන) පනත් කෙටුම්පත 1973 මාර්තු 09 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී, (ii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 8 දරන අල් ලස් (විශේෂ අධිකරණ බල) පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 9 දරන වී නිපද වන්නන්ගේ ඉතිරි කිරීම් පනත 1973 මාර්තු 16 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේක වශයෙන් පළවේ.

## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම

### දකුණු පළාත

**ගාල්ලේ දිස්ත්‍රික් උසාවි නඩු ශාලාවේදීය**

මීපේ, හප්පාවන පදිංචි හීනටිගල කොස්මුල්ලගේ පීරිස් අප්පුහාමි ................................................ පැමිණිලිකාරයා.

නොම්මරය : එම්. බී. 2453 එදිරිව

මීපේ, හප්පාවන පදිංචි හප්පාවන ගාර්දියේ හේවාවසන් ගුණසේන සහ තවත් අය ................................................ විත්තිකරුවන්.

මෙහි පහත සඳහන් වෙන දේපළවලින් ඉහත කී නඩුවේ විත්තිකරුවන්ට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයන් වර්ෂ 1973 ක්වූ අප්‍රේල් මස 04 දින පෙරවරු 10 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

මුදල් රු. 750 ක් ද, ඊට 1971. 5. 31 දින සිට නීති පොලිය සහ නඩු ගාස්තු රු. 276.75 ක් ද අයකර ගැනීම සඳහා.

උපලේඛනය

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පේ පත්තුවේ මීපේ හප්පාවන පිහිටි ගොඩගමකුඹුර නමැති උතුරට : ගොඩගමුවත්ත සහ බුලුගහවත්ත ද; නැගෙනහිරට : කනත්තෙගෙ ඉරවල්ල සහ ගැටගහ කුඹුර ද; දකුණට : ගැටගහවත්ත සහ බුලුගහවත්ත ද; බස්නාහිරට : ඉහළ ගොඩගම කුඹුර ද යන මායිම් තුළ වපසරිය වී අමුණක් ප්‍රමාණ කුඹුරෙන් නොබෙදූ දහසයෙන් පංගු තුන (3/16) ක් වේ.

මු. ජෝ. පී. ගුණතිලක,
නියෝජ්‍ය පිස්කල්, ගාල්ල.

වර්ෂ 1973 ක්වූ පෙබරවාරි මස 26 වන දින,
ගාල්ල පිස්කල් කන්තෝරුවේ දී ය.

3-718—73.03.16 දින අංක 51 දරණ ගැසට් පත්‍රය.

### සබරගමු පළාත

**සබරගමු පළාතේ කෑගල්ලේ දිස්ත්‍රික් නඩුශාලාවේදීය**

කොළඹ දේශීය ආදායම් කොමසාරිස් තුමා............... පෙත්සම්කරු.

නොම්මරය : කෑ.දි.උ. 2128/ඊ එදිරිව

මියගිය ආර්. ඩබ්ලිව්. ඇම්. ඩී. බණ්ඩා දැදිගමගේ බූදලය බලකරු වන ආර්. ඩබ්ලිව්. ඇම්. පරාක්‍රම දැදිගම ............ වගඋත්තරකරු.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහතකී නඩුවේ වග උත්තරකරුට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයන් 1973 අප්‍රේල් මස 10 දින පෙ. ව. 10.30 ට පිහිටි ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

උපලේඛනය

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරලයේ කීරවැලි පත්තුවේ නැගෙනහිර දැදිගම සහ ගම පිහිටි අක්කර 3 ක් (තුනක්) විශාල "පොල් ගහඹිවිටේහිටිනාවත්ත" නැමැති ඉඩමට මායිම් :—

උතුරට : ඩහවලව්ව වත්ත සහ වලව්ටගේ වත්ත;
නැගෙනහිරට : අස්සැද්දුම සහ පතගල්ල කුඹුරු;
දකුණට : ඇල සහ පොල් ගහඹිවිටේවත්ත;
බස්නාහිරට : බොරළුවකුඹුර සහ පතියවක්කලම කුඹුර.

යන සතර මායිම් තුළ පිහිටි දේපලවල මියගිය ආර්. ඩබ්ලිව්. ඇම්. ඩී. බණ්ඩා දැදිගම යන අය සතු වූ බලය, අයිතිය සහ හිමිකම වේ.

අයවිය යුතු ඇස්තමේන්තු මුදල.—රුපියල් 466.74 ක් ද, 1969.8.16 වෙනි දින සිට ගෙවීමේ දිනය දක්වා වර්ෂයකට සියයකට හතර බැගින් පොලියද, පවුන්ඩේජ් ගාස්තු, පිස්කල් ගාස්තුද වේ.

මු. හ. මු. මන්සූර්,
කෑගල්ලේ අතිරේක නියෝජ්‍ය පිස්කල්.

වර්ෂ 1973 මාර්තු මස 07 වැනි දින.
සබරගමු පළාතේ
කෑගල්ලේ නියෝජ්‍ය පිස්කල් කන්තෝරුවේ දී ය.

3-716—73.03.16 දින අංක 51 දරණ ගැසට් පත්‍රය.

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් බාරගනු නොලැබේ.**

**1970 ජූනි මස 2 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

# බූදල් නඩු පිළිබඳ දැන්වීම්

**පානදුර දිස්ත්‍රික් උසාවියේ දීය**

**නයිසයි ආඥවයි**

නැසීගිය මාන්නගේ දොන් දාවිත් ගුණරත්නගේ අන්තිම කැමැත්තක් නොමැති දේපොල සම්බන්ධවයි.

**මාකන්දන පදිංචි පැටිකිරිගේ දෝන යබෝ නෝනා ..............................................පෙත් සම්කාරිය.**

අංක 1260/බූදල්. **එදිරිව**

(1) වැල්ලවත්තේ නෙල්සන් පෙදෙසේ අංක 26 හි පදිංචි මාන්නගේ දොන් අබේසිල ගුණරත්න. (2) මාකන්දන පදිංචි මාන්නගේ දොන් පද්මසිරි ගුණරත්න. (3) පිළියන්දල මාම්පෙ පදිංචි මාන්නගේ දොන් චන්ද්‍රදාස ගුණරත්න. (4) කෝට්ටේ පදිංචි මාන්නගේ දොන් කරුණාදාස ගුණරත්න........................................වගඋත්තරකරුවෝ.

ඉහත සඳහන් පෙත්සම්කාරිය වෙනුවෙන් නීතිඥ ගුණතිලක සහ කොරයා මහත්වරු පෙනී සිටියදී වර්ෂ 1972 ඔක්තෝබර් මස 10 වෙනි දින පානදුරේ අතිරේක දිස්ත්‍රික් විනිශ්චයකාර තැන්පත් කේ. වී. ස්වර්ණාධිපති මහතා ඉදිරිපිට මෙම කාරණය සුදුස්සක් කරණු ලැබීම පිණිස ගෙන, ඉහතකී පෙත්සම්කාරියගේ 1972 සැප්තැම්බර් මස 27 වෙනි දින දරන දිවුරුම් ප්‍රකාශය කියවා බලා :

ඉහත කී වගඋත්තරකරුවන් හෝ මේ සම්බන්ධව උනන්දුවක් දක්වන අයෙක් හෝ අයවළුන් හෝ වර්ෂ 1972 නොවැම්බර් මස 28 වෙනි දින හෝ ඊට පෙර මෙම අධිකරණය සෑහීමකට පත්වන පරිදි එයට විරුද්ධව සෑහෙන හේතු දක්වනු නොලැබුවහොත් එකී පෙත්සම්කාරියට නැසීගිය අයගේ කැමති පත්‍රයක් නොමැති බූදලය පිළිබඳ අද්මිනිස්ත්‍රාසි බල කඩදාසිය නිකුත් කරනු ලබන බවට නියෝග කරන ලදී.

කු. වි. ස්වර්ණාධිපති,
අතිරේක දිස්ත්‍රික් විනිශ්චයකාර තැන.

**1972 ඔක්තෝබර් මස 23 දින.**

**විරුද්ධවාදිකම් දැක්වීමේ දිනය 1973.1.25 දින දක්වා දීර්ඝ කරන ලදී.**
**1972.11.28**

කු. පි. ස්වර්ණාධිපති,
අ. දි. වි.

විරුද්ධවාදිකම් දැක්වීමේ දිනය 1973.3.22 දක්වා දීර්ඝ කරණ ලදී.

කු. වි. ස්වර්ණාධිපති,
අ. දි. වි.

**1973.1.25**
**3-585—73.03.16** දින අංක **51** දරණ ගැසට් පත්‍රය.

---

**පානදුර දිස්ත්‍රික් උසාවියේ දීය**

**නයිසයි ආඥවයි**

මොරටුවේ එගොඩඋයනේ දුම්රිය පොළ පාරේ අංක 10 දරණ ස්ථානයෙහි පදිංචිව සිටි නැසී ගිය වර්ණකුල ජයසූරිය ගුණවර්ධන සෙල්ලප් පෙරුමගේ සිසිලින් ප්‍රනාන්දුගේ අන්තිම කැමති පත්‍රයක් නොමැති බූදලයේ කරුණ පිළිබඳවයි.

**මොරටුවේ එගොඩඋයනේ දුම්රිය පොළු පාරේ අංක 10 දරණ ස්ථානයෙහි පදිංචි තෙල්ගේ හෝමසිලි පීරිස්.........පෙත්සම්කාරි.**

**තෙස්තමේන්තු නඩු අංක 1259/බූ විරුද්ධව**

(1) දෙහිවල මල්වත්ත පාරේ අංක 107 දරණ ස්ථානයෙහි පදිංචි තෙල්ගේ සිසී මාලිනී වීරසූරිය විවාහයට පෙර පීරිස්, (2) මොරටුවේ එගොඩඋයනේ දුම්රිය පොළ පාරේ අංක 10 දරණ ස්ථානයෙහි පදිංචි තෙල්ගේ රෝස්ලින් මල්ලිකා පීරිස් ........................................ වගඋත්තරකරුවෝ.

**වර්ෂ 1972 නොවැම්බර් මස 16 වෙනි දින පානදුර අතිරේක දිසා විනිසුරු තැන්පත් කේ. වී. ස්වර්ණාධිපති මහතාණන් ඉදිරිපිට පෙත්සම්කාරි වෙනුවෙන් ස්ටේම්බු සහ ස්ටේම්බු නීතිඥ මහතුන් පෙනී සිටියදී මෙම කරුණ සුදුස්සක් සඳහා ඉදිරිපත් වූ හෙයින්** පෙත්සම්කාරි විසින් ඉදිරිපත් කරන ලද 1972.9.23 වන දින දරණ ඇයගේ දිවුරුම් ප්‍රකාශය හා 1972.9.28 වන දින දරණ පෙත්සම කියවා බලා ඉහතකී වගඋත්තරකාරියන් හෝ මේ සම්බන්ධයෙන් සැළකිලිමත් වෙන වෙනයම් අයෙක් හෝ අයවළුන් විසින් වර්ෂ 1973 ජනවාරි මස 9 වන දින හෝ එයට පෙර මෙම උසාවියට ඒත්තු යනාකාර සෑහෙන විරුද්ධතාවයන් ඉදිරිපත් නොකළහොත් ඉහති කී නැසීගිය අයගේ දුවණියක් වශයෙන් මෙම බූදලය පිළිබඳ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය නිකුත් කරවා ගනු ලැබීමට පෙත්සම්කාරියට හිමිකම් ලැබිය යුතු බව මෙයින් නියෝග කරනු ලැබේ.

**කේ. වී. ස්වර්ණාධිපති,**
**අතිරේක දිසා විනිසුරුතුමා.**

වර්ෂ **1972** ක්වූ නොවැම්බර් මස **16** වෙනි දින.

ඉහත කී නයිසයි ආඥව සඳහා විරුද්ධතාවයන් ඉදිරිපත් කිරීමේ දිනය **1973.3.27** දක්වා දීර්ඝ කරන ලදී.

**කේ. වී. ස්වර්ණාධිපති,**
**අතිරේක දිසා විනිසුරුතුමා.**

1973. 1. 9.
**3-590—73.03.16** දින අංක **51** දරණ ගැසට් පත්‍රය.

---

**තංගල්ලේ දිස්ත්‍රික් උසාවියේ දීය**

**නයිසයි ආඥවයි**

ඇත්ගාල්මුල්ලේ සිට නැසී ගිය දොන් ජුවානිස් විජේසේකර ගේ තෙස්තමේන්තු බූදල් නඩුවේ කාරණාව ගැනයි.

විතාරන්දෙනියේ, ඇත්ගාල්මුල්ලේ පදිංචි, දොන් කරෝලිස් විජේයේකර ........................................ **පෙත්සම්කරු.**

තෙස්තමේන්තු බූදල් නඩු අංකය : පී/1618 **එදිරිව**

(1) විතාරන්දෙනියේ, ඇත්ගල්මුල්ලේ පදිංචි මැණික්හාමි රණවීර (2) එම ගම පදිංචි උපමල්ලිකා විජේසේකර. (3) එම ගම පදිංචි සෝමාවතී විජේසේකර. (4) එම ගම පදිංචි ඇල්බට් විජේසේකර. (5) එම ගම පදිංචි ධම්මදාස විජේසේකර. (6) කිරින්දේ, පුහුල්වැල්ලේ පදිංචි ජේමවතී විජේසේකර. (7) විතාරන්දෙනියේ, ඇත්ගාල්මුල්ලේ පදිංචි ඇලිස් විජේසේකර. ........................................ **වගඋත්තරකරුවෝ.**

**ඉහත සඳහන් කාරණය තීරණය කිරීම පිණිස වර්ෂ 1973 ක්වූ පෙබරවාරි මස 12 වන දින, තංගල්ලේ දිස්ත්‍රික් විනිශ්චයකාර තැන්පත් ටී. එන්. අබේවීර මැතිතුමන් ඉදිරිපිටදී පෙත්සම්කරු වෙනුවෙන් ඔහුගේ නීතිඥ: එච්. එස්. ද සිල්වා මහතා පෙනී සිටිමින් වර්ෂ 1971 ජනවාරි මස 7 වන දින දරණ පෙත්සමද වර්ෂ 1971 ජනවාරි මස 6 වන දින දරණ දිවුරුම් ප්‍රකාශනයද කියවා බලා මෙසේ නියෝග කරන්ට යෙදුනා ඇත.**

**ඉහත සඳහන් නැසීගිය දොන් ජුවානිස් විජේසේකරගේ තෙස්තමේන්තු බූදලය පිළිබඳව වගඋත්තර කියන්නන් හෝ සැලකිල්ලක් දක්වන්නන් විසින් වර්ෂ 1973 ක් වූ අප්‍රේල් මස 9 වන දින හෝ එදිනට පෙර මෙම උසාවියට පිළිගත හැකි ප්‍රකාර සෑහෙන විරුද්ධවාදිකම් ඉදිරිපත් නොකළහොත් ඉහතකී නැසී ගිය අයගේ වැඩිමහල් පුත්‍රයා වූ ඉහතකී පෙත්සම්කරුට ඒ පිළිබඳ අද්මිනිස්ත්‍රාසි බලකඩදාසිය නිකුත් කිරීම පිණිස නියෝග කරන්ට යෙදෙනවා ඇත.**

**ටී. එන්. අබේවීර,**
**දිස්ත්‍රික් විනිශ්චයකාර තැන.**

1973 පෙබරවාරි මස **12** වන දින දීය.
**3-595—73.03.16** දින අංක **51** දරණ ගැසට් පත්‍රය.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| පෙබරවාරි ... | 73. 2. 2 සිකුරාදා .. | 73. 1.26 සිකුරාදා | දවල් 12.00 |
| | 73. 2. 9 සිකුරාදා ... | 73. 2. 2 සිකුරාදා | දවල් 12.00 |
| | 73. 2.15 බ්‍රහස්පතින්දා ... | 73. 2. 9 සිකුරාදා | දවල් 12.00 |
| | 73. 2.23 සිකුරාදා ... | 73. 2.15 බ්‍රහස්. | දවල් 12.00 |
| මාර්තු ... | 73. 3. 2 සිකුරාදා ... | 73. 2.23 සිකුරාදා | දවල් 12.00 |
| | 73. 3. 9 සිකුරාදා ... | 73. 3. 2 සිකුරාදා | දවල් 12.00 |
| | 73. 3.16 සිකුරාදා ... | 73. 3. 9 සිකුරාදා | දවල් 12.00 |
| | 73. 3.23 සිකුරාදා ... | 73. 3.16 සිකුරාදා | දවල් 12.00 |
| | 73. 3.30 සිකුරාදා ... | 73. 3.23 සිකුරාදා | දවල් 12.00 |
| අප්‍රේල් ... | 73. 4. 6 සිකුරාදා ... | 73. 3.30 සිකුරාදා | දවල් 12.00 |
| | 73. 4.11 බදාදා ... | 73. 4. 6 සිකුරාදා | දවල් 12.00 |
| | 73. 4.19 බ්‍රහස්පතින්දා ... | 73. 4.11 බදාදා | දවල් 12.00 |
| | 73. 4.27 සිකුරාදා ... | 73. 4.19 බ්‍රහස්. | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.